# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/10 - 2023 අගෝස්තු මස 29 වැනි අඟහරුවාදා - 2023.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 අංක 2 දරන සාමදාන විනිශ්චයකාර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ස්ථිර සහ සක්‍රිය සේවයේ නියුතු සෑම පරිවාස නිලධාරියකුම නිල බලයෙන් එකී නිලධාරියා පත්කර ලැබ සිටින අදාළ පළාතේ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු විය යුතු ය.

3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත කොට ස්ථිර සහ සක්‍රීයව සේවයේ නියුතු සෑම ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකරණ නිලධාරියෙකුම නිල බලයෙන් එකී නිලධාරියා පත්කර ලැබ සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් වන අදාළ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාරවරයෙකු විය යුතු ය.

EOG - 08-0280

1A - G 40215 — 406 (2023/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*